# (ඊ) බැංකු ගනුදෙනු සහ ණය

**මහ බැංකුව**

1960 ට පෙරාතු අවුරුදු හා සසඳන විට, 1962 දී ගෙවුම් ශේෂ තත්ත්වය දියුණු අතට හැරුන ද, මේ වසරේ මුල් නව මාසය තුළ, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය, අඩු වෙමින් පැවතිණි. 1962 දී ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 3·26 කින් හෙවත් සියයට 17·7 කින් අඩුවිය. එහෙත් පසුගිය වසරේ අඩුවීම, රුපියල් කෝටි 0·55 ක් හෙවත් සියයට 2·9 ක් විය. වෙළෙඳ බැංකු සහ එම සේවකයන් අතර ආරාවුල පැවැති සමයේ, නොගෙවන ලද ආනයන බිල්පත් එකතුවීම නිසා ජාත්‍යන්තර සංචිතය වැඩිවන අතට හැරිණි. මේ වැඩිවීම, මේ කාලයේදී මුදල් සැපැයුමෙහි, සංඛ්‍යාවලින් පමණක් දිස්වුන, උද්ධමනයට බොහෝ සෙයින් සමානුරූප විය. 1962 ජූනි වන විට, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි නියම ප්‍රමාණය හෙළිවන්නට විය, ජාත්‍යන්තර සංචිතය සැප්තැම්බර් මාසය වන විට රුපියල් කෝටි 17·11 සිට රුපියල් කෝටි 12·37 තෙක් අඩුවී ගියේය. මෙය සටහන් වී ඇති අඩුම මට්ටම විය. පසුගිය අවුරුද්දේ ජාත්‍යන්තර සංචිතයේ සටහන් වී ඇති අඩුම මට්ටම වන රුපියල් කෝටි 17·58, 1961 පෙබරවාරි යේදී ඇති විය. 1962 ඔක්තෝබර් මාසයේ සිට, මහබැංකු ජාත්‍යන්තර සංචිතය කෙමෙන් වැඩිවූයේ අවුරුද්ද අවසාන වන විට, රුපියල් කෝටි 15·21 තෙක් නැඟ තිබිණි. 1962 අවසාන තෙමස තුළදී ජාත්‍යන්තර සංචිතය මඳක් වැඩිවීමෙන් මේ කාලයේ ගෙවුම් ශේෂ තත්ත්වයෙහි ඇතිවූ දියුණුව පිළිබිඹු වෙයි. ප්‍රධාන වශයෙන්ම, මෙයට හේතුවූයේ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කැරුන දැඩි ප්‍රතිපත්තිය නිසා මෙරටට භාණ්ඩ ගෙන්වීම විශාල ලෙස නතර කිරීමය. 1962 ජාත්‍යන්තර සංචිතයේ සාමාන්‍යය රුපියල් කෝටි 16·74 ක් විය. 1961 මාසික සාමාන්‍යය රුපියල් කෝටි 20·37 ක් විය.

1961 අවසානයේදී රුපියල් කෝටි 94·25 ක් වූ මහ බැංකුවේ මුළු දේශීය වත්කම් ප්‍රමාණය 1962 දෙසැම්බර් මාසය අවසාන වන විට, රුපියල් කෝටි 15·77 කින් වැඩි වීමෙන් රුපියල් කෝටි 110·02 ක් විය. මහ බැංකුවෙන් රජයට දෙනලද අත්තිකාරම් රුපියල් කෝටි 0·3 කින් වැඩි වූයේ රුපියල් කෝටි 19·32 සිට රුපියල් කෝටි 19·62 තෙක් වැඩිවිය. 1962 ජූනි මාසයේ සිට ඔක්තෝබර් මාසය වන විට මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 19·60 සිට 17·52 දක්වා අඩු විය. එහෙත්, ඊටපසු, අවුරුද්ද අවසාන වන විට, නැවත රුපියල් කෝටි 19·62 තෙක් වැඩි විය. මෙසේ මහ බැංකුවෙන් රජයට කෙලින්ම දෙනලද අත්තිකාරම් වැඩිවීමත් සමගම මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් සහ රජය විසින් ඇප වූ සුරැකුම්පත් ප්‍රමාණය ද, රුපියල් කෝටි 17·59 කින් වැඩි වූයේ, රුපියල් කෝටි 70·95 සිට රුපියල් කෝටි 88·54 තෙක් ඉහළ ගියේය. මේ මුළු ගණනින් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 17·75 කින් රුපියල් කෝටි 68·89 සිට රුපියල් කෝටි 86·64 තෙක් සම කාලය තුළදී වැඩි විය. බැංකුව සතු රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් 1961 දීට වඩා වැඩිවිය. 1961 දී ඒ වැඩි වූයේ රුපියල් කෝටි 14·08 කිනි.

වෙළෙඳ බැංකු සහ එම සේවකයන් අතර ආරාවුල තුබුණ කාල සීමාවේ දී හැර, 1962 දී වෙළෙඳ බැංකුවල සංචිත තත්ත්වයෙහි පසුගිය අවුරුද්දේ පැවැති තත්ත්වයට වැඩියෙන් වෙනසෙක් ඇති නොවිය. 1962 සැප්තැම්බර් මාසයේදී හා දෙසැම්බර් මාසයේදී හැර අධිසංචිත ප්‍රමාණය රුපියල් කෝටි 0·15 ඉක්ම වූයේ නොවේ. බැංකු සියල්ල එකට ගෙන සලකා බලන විට, බැංකු සංචිත අඩු මට්ටමක පැවැති නිසා බොහෝ බැංකු වලට මහ බැංකුවෙන් පිළි සරණ සෙවීමට සිදු විය. මේ සමගම ඒ ඒ බැංකු අතර, සංචිත අසමානව බෙදීයාම නිසා, බැංකු අතර ණය ගනුදෙනුවද වැඩිවිය.

මේ වාර්තාවෙහි ඉහත කොටසේ සඳහන් කළ පරිදි, පසුගිය අවුරුදු කීපය තුළ මුදල් සැපැයුමෙහි ව්‍යවහාර මුදල් කොටස වැඩිවී ඇසද, 1962 දී එය එතරම්, කැපී පෙනුනේ නොවේ. 1961 මුදල් නෝට්ටු හා කාසි රුපියල් කෝටි 11·9 කින් වැඩි වුවද, 1962 දී වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 2·6 කින් පමණෙකි. නෝට්ටු හා කාසි වැඩිවීම එතරම් කැපී නොපෙනුනේ බැංකු තැන්පතු වැඩිවීම නිසාය. බැංකු තැන්පතු වැඩිවූයේ විශේෂයෙන්, මෙයට පෙරාතුව බැංකු පහසුකම් නොතිබුන, පලාත්වල මහජන බැංකුවේ ශාඛා විවෘත කිරීම නිසාය. සාමාන්‍ය බැංකු කටයුතු අවුල් වී යාමේ හේතුව නිසා අවුරුද්දේ මුල් තෙමස තුළ ව්‍යවහාර මුදල් නිකුතුව වේග යෙන් වැඩිවී ගියද, 1962 නොවැම්බර් වන විට, මුදල් නිකුතුව රුපියල් කෝටි 76·56 තෙක් අඩුවීය. දෙසැම්බර් මාසයේදී මුදල් නිකුතුව රුපියල් කෝටි 78·94 තෙක් වැඩිවිය. මෙය පාරි භෝගික වියදම් වැඩිවීම සහ මේ මාසයේදී සිරිත් පරිදි වන වැඩිවීම නිසා වූවකි. 1962 හැඩ ගැස්ම අනුව, ඉල්ලුම් තැන්පතු හා සසඳන විට, ව්‍යවහාර මුදල් වැඩිවී යාම තරමක් දුරට මැඩ පවත්වා ඇති බවත්, රටේ බැංකු පහසුකම් වැඩි වීමත් සමග මේ තත්ත්වය තවත් දියුණු වියහැකි බවත් පෙනේ. වෙළෙඳ බැංකු මහ බැංකුවේ තැන්පත් කළ මුදල් රුපියල් කෝටි 2·01 කින් රුපියල් කෝටි 8·66 සිට රුපියල් කෝටි 10·67 තෙක් වැඩිවිය. මෙසේ තැන්පතු වැඩිවීමට හේතු වූයේ අවුරුද්ද තුළ බැංකුවල තැන්පත් කැරුන මුළු තැන්පතු වැඩිවීම නිසා ඒ පමණට අවශ්‍ය සංචිත වැඩි කිරීමය. ජාත්‍යන්තර සංවිධාන වල සහ විදේශ රාජ්‍ය වල ද, විදේශීය බැංකු ආයතන වල ද, තැන්පතු රුපියල් කෝටි 5·95 කින්, රුපියල් කෝටි 12·84 සිට රුපියල් කෝටි 18·79 තෙක් වේගයෙන් වැඩිවිය. ජනවාරි මාසයේදී රුපියල් කෝටි 12·65 ක් වූ මේ තැන්පතු පෙබරවාරි මාසය වන විට රුපියල් කෝටි 17·98 තෙක් වේගයෙන් වැඩි විය. නැවත නොවැම්බර් මාසයේ දී රුපියල් කෝටි 17·9 සිට දෙසැම්බර් මාසය වන විට, රුපියල් කෝටි 18·79 තෙක් වැඩි විය. මේ තැන්පතු මෙසේ වැඩිවීමට ප්‍රධානතම හේතුව වූයේ 1962 පෙබරවාරි මාසයේදී ජාත්‍යන්තර මුදල් මණ්ඩලයෙන් රුපියල් කෝටි 5·38 ක් මිලයට ගැනීමය. මුළු මුදල් නිකුතුව සහ අනෙකුත් ඉල්ලුම් වගකීම් වැඩිවීමත් සමග ජාත්‍යන්තර සංචිතයේ වූ අනුපාතය, සියයට 18·7 සිට සියයට 13·9 දක්වා වේගයෙන් අඩු විය. පසුගිය කිසිම වසරකදී ව්‍යවහාර මුදල් වලට හා ඉල්ලුම් වගකීම් වලට ජාත්‍යන්තර සංචිතයේ වූ අනුපාතය මේ මට්ටමට පහළ වැටී නොමැත.

**ණය ප්‍රතිපත්තිය**

රටට අයිති විදේශීය විනිමය සීඝ්‍රයෙන් පහළ වැටීම නවත්වාලීමේ අටියෙන් සකසා, පසුගිය තුන් වසර තුළ ක්‍රියාත්මක කරන ලද ණය ප්‍රතිපත්තිය, සමාලෝචනයට භාජනවී ඇති මේ වසරේ ද, මහ බැංකුව විසින් එලෙසම පවත්වා ගෙන යන ලදී. මහ බැංකුව මේ ණය සීමා කිරීම් පවත්වා ගෙන යාමෙන්, රජය විසින් පනවා ඇති ආනයන සීමා කිරීමේ දැඩි ක්‍රියා මාර්ගය ශක්තිමත් කිරීමට උදව් විය. විදේශීන් සතුව ලංකාවේ ඇති වතු සහ දේපළ මිලයට ගැනීමට, වෙළෙඳ බැංකුවලින් දෙන ලද ණය සීමා කිරීම්, 1962 දෙසැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් සංශෝධනය කරන ලදී. ලංකා වාසීන්ට හෝ ලංකාවේ ලියාපදිංචි සමාගම්වලට හෝ විදේශීන් සතු වූ හෝ නොවූ වතු මිලයට ගැනීම සඳහා දෙනු ලබන වෙළෙඳ බැංකු ණය එම වතු මිලයට ගැනීමේ දී ගෙවනු ලබන මුදලෙන් සියයට $33\frac{1}{3}$ නොවැඩි විය යුතු යැයි මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියෝග කැරිණි. මේ සීමා කිරීම, ලංකා වාසීන්ට හෝ ලංකාවේ ලියාපදිංචි සමාගම් වලට හෝ ලංකාවෙන් පිටත වාසය කරන්නන් සතු හෝ ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් සතු හෝ නිශ්චල දේපොළ (වතුහැර) මිලයට ගැනීම සඳහා දෙනු ලබන බැංකු ණය සම්බන්ධයෙන් ද බලපවත් වනු ලැබේ.

වසර තුළ දී වෙළෙඳ බැංකුවල ද්‍රවශීලතාවය අඩු මට්ටමක පැවැති නිසා, වෙළෙඳ බැංකු ණයදීම් අඩු කිරීම සඳහා සීමා කිරීම් අවශ්‍ය වූයේ නැත. මෙ රටට බඩු ගෙන්වීම සීමා කිරීමත් සමග ම බඩු ගෙන්වීම සඳහා වෙළෙඳ බැංකු වලින් දෙන ලද ණය ප්‍රමාණය ද, අවුරුද්ද තුළ නිතැතින් ම අඩු විය. මේ සමග ම, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම, මහජනයා සතු මුදල් ශේෂයන් වැඩි කර ගැනීමට ඇති උනන්දුව හෙළි කැරෙන ලකුණක් විය. මෙය සමහර විට බඩු ගෙන්වීම හා වක්ව කැරුන අනෙකුත් සීමා කිරීම් නිසා, පාරිභෝගික කටයුතු සඳහා වියදම් කිරීමට ඇති මාර්ග සීමාවීම නිසා ඇති වූවකි.

### වෙළෙඳ බැංකු

1961 ජූලි මාසයේ දී ව්‍යාපාර කටයුතු ඇරැඹූ මහජන බැංකුව, වේගයෙන් පුළුල් කිරීමේ සිය ප්‍රතිපත්තිය 1962 දී ද එසේම ගෙන ගියේය. 1961 අවසානය වන විට බැංකුව විසින් කොළඹින් පිට ශාඛා 7 ක් විවෘත කරන ලදී. 1962 අවසානය දකිත්ම කොළඹින් පිට බැංකු ශාඛා ගණන 24 දක්වා වැඩි-විය. මෙයින් ශාඛා 15 ක්ම විවෘත කැරුනේ මෙතෙක් බැංකු පහසුකම් නො තිබුන නගරවලය. ලංකා බැංකුව අවුරුද්ද තුළ එක ද බැංකු ශාඛාවක් විවෘත නොකළේය. එහි බැංකු කාර්යාල ගණන පෙරසේම 27 ක්ව පැවැතිණි. 1962 අවසාන වන විට ලංකාවේ තිබූ මුළු බැංකු කාර්යාල ගණන 72 ක් විය. මෙයින් 20 ක්ම පිහිටියේ කොළඹය. 1962 අවසාන වන විට ලංකාවේ තුබූ බැංකු කාර්යාල ගණන සහ බැංකු තැන්පතු ප්‍රමාණය විදේශීය හා දේශීය බැංකු අතර බෙදී ගිය අයුරු පහත සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

සංඛ්‍යා සටහන II ඊ—1

## බැංකු කාර්යාල හා තැන්පතු බෙදී ගිය අයුරු

| මුළු ගණන | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ අනෙකුත් බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | ප්‍රමාණය (රුපියල් මිලියන) | % | | ප්‍රමාණය (රුපියල් මිලියන) | % | | ප්‍රමාණය (රුපියල් මිලියන) | % | | ප්‍රමාණය (රුපියල් මිලියන) | % |
| 72 | 1182 | 100 | 55 | 683 | 58 | 12 | 428 | 36 | 5 | 70 | 6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු පරිශිෂ්ටයේ 4 වැනි සංඛ්‍යා සටහනේ සවිස්තරව දක්වා ඇත. පහත සංඛ්‍යා සටහනින් දැක්වෙනුයේ එහි සාරාංශයයි.

සංඛ්‍යා සටහන II ඊ—2

## වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

(මාසික සංඛ්‍යා සාමාන්‍යය)

රුපියල් දශ ලක්ෂ

| | 1952 | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති කාසි සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ද ඇතුළුව) .. | 177 | 128 | 106 | 149 | 148 | 139 | 119 | 116 | 132 | 148 | 186 |
| විදේශීය මුදල් ශේෂ .. | 97 | 44 | 55 | 112 | 116 | 72 | 50 | 52 | 58 | 54 | 55 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 39 | 55 | 60 | 51 | 39 | 34 | 16 | 24 | 28 | 51 | 89 |
| වට්ටම් කළ බිල්පත් .. | 64 | 65 | 73 | 94 | 93 | 100 | 116 | 119 | 115 | 122 | 136 |
| මුළු ද්‍රවශීල වත්කම් .. | 377 | 292 | 294 | 406 | 396 | 345 | 301 | 311 | 333 | 375 | 466 |
| මුළු ආයෝජන (1) .. | 235 | 235 | 221 | 245 | 291 | 308 | 296 | 285 | 284 | 290 | 303 |
| මුළු ණය දීම් හා අයිරාවන් .. | 176 | 182 | 208 | 244 | 273 | 340 | 363 | 395 | 430 | 435 | 478 |
| ඉල්ලුම් තැන්පතු (2) .. | 653 | 573 | 562 | 675 | 731 | 721 | 661 | 655 | 657 | 677 | 826 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. .. | 95 | 102 | 126 | 190 | 206 | 240 | 263 | 300 | 340 | 359 | 380 |
| මුළු තැන්පතු .. .. | 754 | 677 | 689 | 869 | 941 | 965 | 926 | 955 | 998 | 1036 | 1210 |
| අනුපාතය:— .. .. | % | % | % | % | % | % | % | % | % | % | % |
| කාසි: ඉල්ලුම් තැන්පතු .. | 27·1 | 22·3 | 18·9 | 22·1 | 20·2 | 19·3 | 18·0 | 17·7 | 20·1 | 21·9 | 22·5 |
| කාසි: මුළු තැන්පතු .. | 23·5 | 18·9 | 15·4 | 17·1 | 15·7 | 14·4 | 12·9 | 12·1 | 13·2 | 14·3 | 15·4 |
| විදේශීය මුදල් මුළු තැන්පතු | 12·9 | 6·5 | 8·0 | 12·9 | 12·3 | 7·5 | 5·4 | 5·4 | 5·8 | 5·2 | 4·5 |
| භාණ්ඩාගාර බිල්පත් මුළු තැන්පතු .. | 5·2 | 8·1 | 8·7 | 5·9 | 4·1 | 3·5 | 1·7 | 2·5 | 2·8 | 4·9 | 7·3 |
| වට්ටම් කළ වෙළෙඳ බිල්පත් මුළු තැන්පතු .. | 8·5 | 9·6 | 10·6 | 10·8 | 9·9 | 10·4 | 12·5 | 12·5 | 11·5 | 11·8 | 11·2 |
| ද්‍රවශීල වත්කම්: ඉල්ලුම් තැන්පතු .. .. | 57·7 | 50·9 | 52·3 | 60·1 | 54·2 | 47·9 | 45·5 | 47·5 | 50·7 | 55·4 | 56·4 |
| ද්‍රවශීල වත්කම් : මුළු තැන්පතු | 50·0 | 43·1 | 42·7 | 46·7 | 42·1 | 35·8 | 32·5 | 32·6 | 33·4 | 36·2 | 38·5 |
| ආයෝජන : මුළු තැන්පතු .. | 31·2 | 34·7 | 32·1 | 28·2 | 30·9 | 31·9 | 32·0 | 29·8 | 28·5 | 28·0 | 25·0 |
| මුළු ණය හා අයිරාවන් මුළු තැන්පතු .. | 23·3 | 26·9 | 30·2 | 28·1 | 29·0 | 35·2 | 39·2 | 41·4 | 43·1 | 42·0 | 39·5 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් සහ මහ බැංකු නිකුතු
(2) දේශීය අන්තර් බැංකු තැන්පතු හැර.

1961 දී වෙළෙඳ බැංකුවල මුළු තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. ඉල්ලුම් තැන්පතු ද, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ද, එක හා සමාන අනුපාතයකින් වැඩි වී ඇත. මුළු තැන්පතු රුපියල් කෝටි 102·1 සිට රුපියල් කෝටි 118·25 තෙක්, රුපියල් කෝටි 16·15 කින් වැඩි විය. ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 65·73 සිට රුපියල් කෝටි 75·61 තෙක් රුපියල් කෝටි 9·88 කින් ද, කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු රුපියල් කෝටි 36·38 සිට රුපියල් කෝටි 42·64 තෙක් රුපියල් කෝටි 6·26 කින් ද වැඩි විය. 1962 තැන්පතු වගකීම්වල මාසික සාමාන්‍යය රුපියල් කෝටි 121·0 ක් විය. පසුගිය අවුරුද්දේ සාමාන්‍යය රුපියල් කෝටි 103·6 ක් විය. තැන්පතු වැඩිවීමට එක් හේතුවක් වූයේ මුදල් සැපයුම වැඩිවීමය. අනෙක් හේතුව වූයේ මහජනයාගේ ඉපැයීම් වලින් වැඩි කොටසක් බැංකු තැන්පතු වශයෙන් තබා ගැනීමට දක්වූ කැමැත්තය. එහෙත් පසුගිය වසරේ මුදලින් ලැබූ ආදයම නෝට්ටු හා කාසි වලින් තබා ගැනීමට ආසාව දක්විණි. ඉල්ලුම් තැන්පතු ද, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ද, වැඩිවීමට තවත් හේතුවක් වූයේ අලුත් බැංකු ශාඛා විවෘත කිරීම නිසා බැංකු පහසුකම් සීඝ්‍ර ලෙස පුළුල් වී යාමය. අලුතෙන් විවෘත කරන ලද බැංකු ශාඛා වලට අළුත් තැන්පතු ලබා ගැනීමට හැකි විය.

පසුගිය වසරේ මෙන් නොව මේ වසරේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීමට බොහෝ සෙයින්ම හේතු වූයේ බඩු ගෙන්වීම සීමා කිරීම නිසා පාරිභෝගික හා කල්පවත්නා භාණ්ඩ විශාල සංඛ්‍යාවක් මිලයට ගැනීමට නොමැතිවීමත්, වැඩිදෙනෙකු භාණ්ඩාගාර බිල්පත් වෙනුවට කාලීන හා ඉතිරිකිරීම් තැන්පතුවලට කැමැත්ත දක්වීමත්, නිසාය. භාණ්ඩ සඳහා වැය විය හැකිව

තුබූ මුදල් දැන් ඉතිරි කිරීම් වශයෙන් තබා ඇත. දේශීය භාණ්ඩ මිල වැඩි කිරීමට උදව් දෙන, වැඩි වන ආදායමින් සැහෙන කොටසක් මෙසේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වශයෙන් තිබීම නිසා ඉන් හිතකාමී ප්‍රතිඵල නොලැබෙන්නේ නොවේ. වර්ෂය තුළ දී ඉතිරි කිරීම් තැන්පතු වැඩි වූයේ වෙළෙඳ බැංකුවල සහ ඉතිරි කිරීම් ආයතනවල ස්ථාවර, තැන්පතු පොලී ප්‍රමාණයෙහි වෙනසෙක් නැතිවය. එකම වෙනස වූයේ ලංකා සේවින්ග්ස් බැංකුවේ තැන්පතු සඳහා ගෙවන ප්‍රමාණය 1962 ජනවාරි මාසයේ දී සියයට ½ කින් වැඩි කිරීමය.

1961 සැප්තැම්බර්, 1961 දෙසැම්බර් සහ 1962 ජූනි අවසානයට බැංකු තැන්පතු අයිතිව තුබූ අන්දම (රජයේ හා බැංකු අතර හැර) පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් දැක්වෙයි. මේ සංඛ්‍යා සටහන සඳහා සංඛ්‍යා තොරතුරු සපයා ගෙන ඇත්තේ බැංකු ණය, අත්තිකාරම් සහ තැන්පතු අයිතිය පිළිබඳව මහ බැංකුව විසින් සමසකට වරක් කැරෙන පරීක්ෂණ මාර්ගයෙනි. මේ පරීක්ෂණය කලින් පරිදි මාර්තු සහ සැප්තැම්බර් අවසානයේ නොව 1962 සිට ජූනි සහ දෙසැම්බර් අවසානයේ පවත්වනු ලැබේ.

සංඛ්‍යා සටහන II ඊ--3

## තැන්පතු අයිතිය

රුපියල් දශ ලක්ෂ

| හිමිකරු | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **මුදල් ආයතන** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 46·5 | 7·8 | 55·0 | 26·6 | 3·7 | 2·9 | 105·2 | 11·3 |
| 1961 දෙසැම්බර් .. .. | 57·1 | 9·9 | 50·0 | 23·2 | 4·4 | 3·4 | 111·5 | 12·1 |
| 1962 ජූනි .. .. | 53·7 | 9·3 | 56·7 | 25·3 | 4·2 | 3·2 | 114·6 | 12·3 |
| **වතු** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 101·4 | 17·1 | 44·4 | 21·4 | 0·1 | ... | 146·0 | 15·7 |
| 1961 දෙසැම්බර් .. .. | 102·1 | 17·6 | 46·3 | 21·5 | 0·9 | 0·7 | 149·2 | 16·2 |
| 1962 ජූනි .. .. | 82·8 | 14·3 | 36·1 | 16·1 | 1·0 | 0·8 | 119·9 | 12·8 |
| **වෙළෙඳ ව්‍යාපාර** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 91·2 | 15·4 | 13·3 | 6·4 | 1·1 | 0·9 | 105·6 | 11·4 |
| 1961 දෙසැම්බර් .. .. | 82·7 | 14·3 | 13·1 | 6·1 | 0·7 | 0·5 | 96·5 | 10·5 |
| 1962 ජූනි .. .. | 113·5 | 19·6 | 12·3 | 5·5 | 2·9 | 2·2 | 128·8 | 13·8 |
| **අනෙකුත් ව්‍යාපාර** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 68·9 | 11·6 | 17·5 | 8·5 | 1·8 | 1·4 | 88·1 | 9·5 |
| 1961 දෙසැම්බර් .. .. | 69·0 | 11·9 | 23·2 | 10·8 | 2·2 | 1·7 | 94·3 | 10·2 |
| 1962 ජූනි .. .. | 71·1 | 12·3 | 28·9 | 12·9 | 3·1 | 2·4 | 103·1 | 11·0 |
| **පළාත් පාලන මණ්ඩල** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 21·0 | 3·5 | 19·0 | 9·2 | 0·2 | 0·2 | 40·2 | 4·3 |
| 1961 දෙසැම්බර් .. .. | 15·1 | 2·6 | 26·1 | 12·1 | 0·2 | 0·2 | 41·5 | 4·5 |
| 1962 ජූනි .. .. | 10·1 | 1·7 | 26·7 | 11·9 | 0·6 | 0·5 | 37·4 | 4·0 |
| **වාණිජ නොවන ආයතන** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 33·8 | 5·7 | 7·3 | 3·5 | 2·3 | 1·8 | 43·4 | 4·7 |
| 1961 දෙසැම්බර් .. .. | 35·1 | 6·1 | 5·8 | 2·7 | 3·3 | 2·6 | 44·2 | 4·8 |
| 1962 ජූනි .. .. | 33·6 | 5·8 | 15·7 | 7·0 | 10·7 | 8·2 | 60·0 | 6·4 |
| **පුද්ගලයන්** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 230·0 | 38·8 | 50·5 | 24·4 | 118·2 | 92·9 | 398·6 | 43·0 |
| 1961 දෙසැම්බර් .. .. | 218·0 | 37·6 | 50·7 | 23·6 | 117·2 | 90·9 | 385·9 | 41·8 |
| 1962 ජූනි .. .. | 213·7 | 36·9 | 47·5 | 21·2 | 108·0 | 82·7 | 369·3 | 39·6 |
| **එකතුව** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. .. | 592·8 | 100·0 | 207·0 | 100·0 | 127·3 | 100·0 | 927·2 | 100·0 |
| 1961 දෙසැම්බර් .. .. | 579·1 | 100·0 | 215·1 | 100·0 | 129·0 | 100·0 | 923·1 | 100·0 |
| 1962 ජූනි .. .. | 578·6 | 100·0 | 224·0 | 100·0 | 130·6 | 100·0 | 933·2 | 100·0 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

ඉහත සංඛ්‍යා සටහනේ එන තොරතුරු අනුව, 1961 දෙසැම්බර් මාසයේ සිට 1962 ජූනි වන විට, මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් කෝටි 0.99 කින් වැඩිවී ඇති බව හෙළිවෙයි. මෙයින් විශාල වශයෙන් වැඩිවී ඇත්තේ කාලීන තැන්පතුය. කාලීන තැන්පතු රුපියල් කෝටි 0·89 කින් වැඩිවී ඇත. ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 0·16 කින් වැඩි වුව ද, ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 0·05 කින් අඩු විය. මේ කාලයේදී ඉතාමත් සැලකිය යුතු වෙනස ලෙස දක්විය හැකි, වැඩිවූ කාලීන තැන්පතු බොහෝ සෙයින්ම, මුදල් ආයතන සහ ''අනෙකුත් ව්‍යාපාර'' සතු කාලීන තැන්පතු විය. වතු සහ පුද්ගලයන් සතු කාලීන තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. ඉල්ලුම් තැන්පතු වලින් බොහෝ සෙයින් පහළ වැටී ඇත්තේ මුදල් ආයතන, වතු, ''ව්‍යාපාර නොවන'' ආයතන සහ පුද්ගලයන් සතු ඉල්ලුම් තැන්පතුය. එහෙත් වෙළෙඳ ආයතන සහ අනෙකුත් ව්‍යාපාර සතු ඉල්ලුම් තැන්පතු වැඩි වී ඇත. අවුරුද්ද තුළ දී ඉතිරි කිරීම් තැන්පතු වෙනස් වූයේ මඳ වශයෙනි. කාලීන තැන්පතු සාමාන්‍යයෙන් වැඩිවී ඇත්තේ, ඉල්ලුම් තැන්පතු ගිණුම් වලින් කාලීන තැන්පතු ගිණුම් වලට මුදල් යෙදවීම නිසාය.

මෙරටට බඩු ගෙන්වීම සීමා කිරීම නිසා අඩුවී ගිය ආනයන වෙළෙඳාමත්, මෙරට වාණිජ ව්‍යාපාර වලට තරමක් වැඩියෙන් මුදල් යෙදවීමත්, වසර තුළ ඇති වූ වෙළෙඳ බැංකු ණය ගනුදෙනු වලින් පිළිබිඹු වෙයි. ආනයන බිල්පත් රුපියල් කෝටි 6·73 සිට රුපියල් කෝටි 4·96 තෙක් රුපියල් කෝටි 1·77 කින් අඩු විය. අපනයන බිල්පත් රුපියල් කෝටි 5·86 සිට රුපියල් කෝටි 6·08 තෙක් රුපියල් කෝටි 0·22 කින් වැඩි විය. අයිරාවන් රුපියල් කෝටි 30·04 සිට රුපියල් කෝටි 27·97 තෙක් රුපියල් කෝටි 2·07 කින් අඩු විය. ණය රුපියල් කෝටි 13·61 සිට රුපියල් කෝටි 16·77 තෙක් රුපියල් කෝටි 3·16 කින් වැඩි විය. බැංකු ආරාවුල පැවැති කාලයේ බැංකු ගනුදෙනු සිරිත් පරිදි නොකැරුන නිසා අයිරාවන් සහ ආනයන බිල්පත් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. ඉතාමත් සැලකිය යුතු ලෙස වැඩිවී ඇත්තේ අයිරාවන්ය. 1962 පෙබරවාරි වන විට මෙය රුපියල් කෝටි 30·04 සිට රුපියල් කෝටි 41·54 තෙක් වැඩි විය. අප්‍රේල් මාසය වන විට, රුපියල් කෝටි 44·59 තෙක් නැවත වැඩි විය. ඊට පසු අයිරාවන් දැන් පවත්නා මට්ටමට ක්‍රමයෙන් අඩු විය. මුල් මාස පහ තුළ අයිරාවන් වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පුද්ගලයන් සහ වෙළෙඳ සමාගම් සතුව තුබූ මුදල් නොකළ චෙක්පත් සහ අනෙකුත් වත්කම් පදනම් කොට මේ අයට වෙළෙඳ බැංකු වලින් ණය දීමය. බැංකු සිය අනුග්‍රාහකයිනට ප්‍රධාන වශයෙන් අයිරාවන් මගින් ණය පහසුකම් සැලසූ නිසා මේ කාලය තුළදී ණය අඩුවිය. බැංකු ගනුදෙනු තාවකාලිකව අත්හිටවීමෙන්, ගෙවිය නොහැකි වූ නිසා මේ කාලය තුළදී අපනයන බිල්පත් වැඩිවිය. වසර තුළදී අයිරාවන් අඩු වූයේ භාණ්ඩ ගෙන්වීම සීමා කිරීම නිසා, පාරිභෝගික භාණ්ඩ සඳහා යෙදවෙන ණය ප්‍රමාණය අඩු වීම නිසාය. එහෙත් ණය වැඩි වී ඇත්තේ බැංකු සමහරක් සිය අනුග්‍රාහකයිනට නිවාස ඉදිකිරීමට සහ රටේ අලුතෙන් අරඹා ඇති කර්මාන්ත වලට යෙදවීමට තරමක් දිගු කාලීන ණය දැනට දීගෙන යන නිසාය.

1962 වසර තුළ වෙළෙඳ බැංකුවල වැඩි වූ ද්‍රවශීලතාවය, අතැති මුදල් ශේෂ වැඩි වීමෙන් හා අනෙකුත් ද්‍රවශීල ශේෂයන් ගෙන් සමන්විත විය. මහ බැංකුවෙහි තැන්පත් කළ වෙළෙඳ බැංකුවල මුදල් ශේෂයන් ද, රුපියල් කෝටි 8·34 සිට රුපියල් කෝටි 10·45 තෙක් රුපියල් කෝටි 2·11 කින් වැඩිවිය. අතැති මුදල් රුපියල් කෝටි 5·73 සිට රුපියල් කෝටි 6·68 තෙක් රුපියල් කෝටි 0·95 කින් වැඩි විය. මහ බැංකුව වෙත තුබුන මුදල් හා තැන්පතුවල සාමාන්‍යය 1962 දී රුපියල් කෝටි 18·6 ක් විය. ඊට පෙර වසරේ රුපියල් කෝටි 14·8 ක් විය. වසරේ මුල් පස් මාසය තුළ අන්තර් බැංකු නිෂ්කාශන කටයුතු තාවකාලිකව අත්හිටවීම නිසා මහ බැංකුවෙහි තුබූ වෙළෙඳ බැංකු වල මුදල් ශේෂ වැඩිවිය. 1962 ජූනි මාසයේදී සිරිත් පරිදි නිෂ්කාශන කටයුතු ඇරඹියාට පසු මේ ශේෂ වල නියම ප්‍රමාණය පිළිබිඹු විය. වෙළෙඳ බැංකු සතු විදේශීය මුදල් රුපියල් කෝටි 4·63 සිට රුපියල් කෝටි 4·07 තෙක් රුපියල් කෝටි 0·56 කින් අඩුවිය. මේ ශේෂයන්ගේ සාමාන්‍යය 1962 දී රුපියල් කෝටි 5·5 ක් වූ අතර 1961 දී රුපියල් කෝටි 5·4 ක් වී තිබිණි. අවුරුද්දේ මුල් නව මාසය තුළ මේ ශේෂ අඩු වීමෙන් දක්වෙනුයේ ගෙවුම් ශේෂයෙහි ඇතිවූ හිඟයයි.

භාණ්ඩාගාර බිල්පත් පොළී ප්‍රමාණය, සියයට 2·68 සිට සියයට 2·80 දක්වා කෙමෙන් වැඩි වෙත්ම, වෙළෙඳ බැංකු සිය භා ණ්ඩාගාර බිල්පත් අයිතිය, රුපියල් කෝටි 6·36 සිට රුපියල් කෝටි 11·14 තෙක් වැඩි කළේය. වෙළෙඳ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් සාමාන්‍යය, පසුගිය වසරේදීට වඩා බොහෝ සෙයින් වැඩිවිය. මේ බිල්පත් අයිතිය ජූනි, ජූලි සහ 1962 අවසාන කාර්තුවේදී වැඩිවිය. වෙළෙඳ බැංකු සතු, රජයේ දිගු කාලීන සුරැකුම්පත්, රුපියල් කෝටි 29·32 සිට

රුපියල් කෝටි 31·68 තෙක් රුපියල් කෝටි 2·36 කින් වැඩිවිය. මේ වැඩිවීම ඇතිවූයේ අවුරුද්ද තුළ නොගෙවා ඇති රාජ්‍ය ණය ප්‍රමාණය ද වැඩි වෙමින් තිබියදීය. නොබේරා ඇති දිගු කාලීන ණය රුපියල් කෝටි 12·58 කින් වැඩිවිය. අතැති මුදල් හා මහ බැංකුව වෙතැති මුදල් ශේෂයන් ද, විදේශීය මුදල් හා භාණ්ඩාගාර බිල්පත් අයිතිය වැඩිවීමත් සමග, 1961 දී රුපියල් කෝටි 37·5 ක් වූ මුළු ද්‍රවශීල වත් කම් ප්‍රමාණය 1962 දී රුපියල් කෝටි 46·6 තෙක් ඉහළ ගියේය. මේ අනුව ඉල්ලුම් තැන්පතු වලට පැවැති ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 55·4 සිට සියයට 56·4 තෙක් වැඩිවිය.

බැංකු ආරාවුල තුබූ සමයේ සංචිත වල ඇතිවූ වැඩිවීම ගණනට නොගත්තේ නම්, 1962 වෙළෙඳ බැංකුවල අධි සංචිත සාමාන්‍යය 1961 සාමාන්‍යයට වඩා එතරම් වැඩිවී නොමැත. 1962 දෙසැම්බර් මාසයේදී අධි සංචිත රුපියල් කෝටි 0·13 කින්, රුපියල් කෝටි 0·96 තෙක් වැඩිවීම සිදුවී ඇති එකම විශේෂය වෙයි. වර්ෂයේ මුල් පස් මාසය තුළ ප්‍රධාන වශයෙන්ම වෙළෙඳ බැංකු මහ බැංකුවේ තැන්පත් කළ මුදල් වැඩිවීම නිසා අධි සංචිත ප්‍රමාණය වැඩිවිය. මෙයට හේතුව මේ කොටසෙහි ඉහත විස්තර කොට ඇත. අවශ්‍ය සංචිත වශයෙන් කැට මුදලින් කොටසක් වෙන් කළ හැකිය, යන විධිවිධානයනට අනුව වෙළෙඳ බැංකු අවුරුද්ද තුළදී, මේ සඳහා කැට මුදල් වැඩි වැඩියෙන් පාවිච්චි කරන ලදී. අවුරුද්දේ දෙවැනි භාගයේදී සංචිත වශයෙන් පාවිච්චි කරන ලද කැට මුදල් ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් රුපියල් කෝටි 1·5 කට ආසන්න විය. අවශ්‍ය සංචිත පෙන්වන මහ බැංකු විවරණිකාවෙහි සහ වාර්ෂික වාර්තාවෙහි සංඛ්‍යා සටහන, වඩා පැහැදිළි ලෙස සංචිත තත්ත්වය පෙන්නුම් කිරීමට සැප්තැම්බර් මාසයේ සිට සංශෝධනය කරන ලදී. ව්‍යවස්ථාපිත සංචිත ප්‍රමාණය සතිපතා හැම සිකුරාදවකම, ඉකුත් බදාදා තුබූ තැන්පතු වගකීම් පදනම් කොට දැනට ගණන් බැලෙන නිසා මේ වාර්තාවේ 9 වැනි සංඛ්‍යා සටහනෙහි ඇති සංචිත පිළිබඳ වූ සංඛ්‍යා, මේ පදනම අනුව ගණන් බලා සංශෝධිත ඒවා වෙයි.

අධි සංචිත මට්ටම අඩුවීම නිසා වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ගත් ණය ද බැංකු අනෙකුත් බැංකු වලින් ගත් ණය ද වැඩිවී ඇත. බොහෝ බැංකු අන්‍යෝන්‍ය වශයෙන් බැංකුවලින් ඒක්ෂණ ණය ලබා ගත්තේය. මෙහි ප්‍රතිඵලය වූයේ සියයට 2 ක් වූ අන්තර් බැංකු ඒක්ෂණ ණය සඳහා වූ උපරිම හා අඩුම පොළිය ජූනි මාසයේදී සියයට $2\frac{3}{4}$ තෙක් වැඩි වීමය. ජූලි මාසයේදී උපරිම පොළී ප්‍රමාණය සියයට 3 තෙක් වැඩිවිය. ඊට පසු උපරිම හා අඩුම පොළී ප්‍රමාණය සියයට $2\frac{3}{4}$ හි ම පැවැත්තේය. නැවතත් දෙසැම්බර් මාසයේදී අන්තර් බැංකු ඒක්ෂණ උපරිම පොළිය සියයට $2\frac{3}{4}$ සිට සියයට 3 තෙක් වැඩිවිය. අඩුම පොළිය සියයට $2\frac{3}{4}$ හිම පැවැතියේය. මෙයින් පිළිබිඹු වූයේ බැංකු අතර, අන්‍යෝන්‍ය ඒක්ෂණ ණය ගනු දෙනු පමණක් නොව, නිදහසේ පාවිච්චිය සඳහා බැංකුවල සැහෙන ප්‍රමාණයක් සංචිත නොතිබීමය. බැංකු අතර අන්‍යෝන්‍ය වශයෙන් ණය ගැනීම වැඩි වෙමින් තිබියදීත්, වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ගත් ණය ජූනි, ජූලි සහ අගෝස්තු මාස වල බොහෝ සෙයින් වැඩිවී තිබෙන බව පහත එන සටහනින් හෙළිවේ. 1962 දෙසැම්බර් මාසයේදී වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ණය නොගැනීමෙන්, වෙළෙඳ බැංකුවල අධි සංචිත වල ඇතිවූ එක්තරා දියුණුවක් පිළිබිඹු කරයි.

සංඛ්‍යා සටහන II ඊ—4

**වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ගත් ණය**

**1961—1962**

රුපියල් දශ ලක්ෂ

| මාසාවසානය * | 1961 | 1962 |
|---|---|---|
| ජනවාරි .. .. .. .. .. | 21·0 | — |
| පෙබරවාරි .. .. .. .. .. | 20·0 | — |
| මාර්තු .. .. .. .. .. | 27·9 | — |
| අප්‍රේල් .. .. .. .. .. | 16·0 | — |
| මැයි .. .. .. .. .. | 17·8 | — |
| ජූනි .. .. .. .. .. | 26·4 | 20·9 |
| ජූලි .. .. .. .. .. | 38·9 | 28·5 |
| අගෝස්තු .. .. .. .. .. | 21·0 | 15·3 |
| සැප්තැම්බර් .. .. .. .. .. | 15·5 | — |
| ඔක්තෝබර් .. .. .. .. .. | 1·0 | 1·6 |
| නොවැම්බර් .. .. .. .. .. | 1·0 | 4·5 |
| දෙසැම්බර් .. .. .. .. .. | 20·6 | — |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

*නොබේරා ඇති ප්‍රමාණය

මේ කොටසේ එන විග්‍රහය පදනම් වී ඇත්තේ ණය සහ අත්තිකාරම් පිළිබඳ 1962 ජූනි මස අවසානයේ පවත්වන ලද අර්ධ වාර්ෂික පරීක්ෂණයේ සංඛ්‍යා අනුව වෙයි.

වෙළෙඳ බැංකු විසින් දෙනලද ණය සහ අත්තිකාරම් අවශ්‍යතාවය සහ කල්පිරීම අනුව වර්ග කොට පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඊ—5

## වෙළෙඳ බැංකු අත්තිකාරම්*—අවශ්‍යතාවන් සහ කල් පිරීම් අනුව

රුපියල් දශ ලක්ෂ

| අවශ්‍යතාවන් | කෙටි කාලීන (මසකට අඩු) | | මැදි කාලීන (මසේ සිට මාස 30 දක්වා) | | දීර්ඝ කාලීන (තිස් මසකට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | 1-7 සියයට ගණන (2) | (3) | 3-7 සියයට ගණන (4) | (5) | 5-7 සියයට ගණන (6) | | එකතුවේ සියයට ගණන-7 (8) |
| **(අ) වාණිජ** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 143·0 | 36·4 | 210·0 | 53·5 | 39·7 | 10·1 | 392·7 | 70·3 |
| 1961 දෙසැම්බර් .. | 137·4 | 36·2 | 200·9 | 53·0 | 41·0 | 10·8 | 379·2 | 69·1 |
| 1962 ජූනි .. | 144·3 | 36·9 | 207·2 | 53·0 | 39·7 | 10·1 | 391·2 | 68·0 |
| **(ආ) මූල්‍ය** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 23·0 | 26·0 | 39·8 | 45·0 | 25·6 | 29·0 | 88·4 | 15·8 |
| 1961 දෙසැම්බර් .. | 22·4 | 25·3 | 41·0 | 46·2 | 25·3 | 28·5 | 88·7 | 16·2 |
| 1962 ජූනි .. | 21·7 | 25·6 | 42·8 | 50·5 | 20·4 | 24·1 | 84·8 | 14·7 |
| **(ඇ) කෘෂිකාර්මික** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 3·5 | 32·4 | 3·7 | 34·3 | 3·6 | 33·3 | 10·8 | 1·9 |
| 1961 දෙසැම්බර් .. | 3·8 | 35·8 | 3·1 | 29·2 | 3·7 | 34·9 | 10·6 | 1·9 |
| 1962 ජූනි .. | 2·7 | 22·5 | 3·9 | 32·5 | 5·3 | 44·2 | 12·0 | 2·0 |
| **(ඈ) කාර්මික** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 2·9 | 10·1 | 14·5 | 50·5 | 11·3 | 39·4 | 28·7 | 5·1 |
| 1961 දෙසැම්බර් .. | 3·2 | 13·3 | 13·6 | 56·7 | 7·2 | 30·0 | 24·0 | 4·4 |
| 1962 ජූනි .. | 2·9 | 9·2 | 14·2 | 45·1 | 14·4 | 45·7 | 31·5 | 5·5 |
| **(ඉ) පාරිභෝගික** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 8·1 | 26·8 | 13·4 | 44·4 | 8·7 | 28·8 | 30·2 | 5·4 |
| 1961 දෙසැම්බර් .. | 10·6 | 32·4 | 13·2 | 40·4 | 8·9 | 27·2 | 32·7 | 6·0 |
| 1962 ජූනි .. | 11·5 | 30·1 | 14·3 | 37·4 | 12·4 | 32·5 | 38·2 | 6·6 |
| **(ඊ) අනෙකුත්** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 0·9 | 11·5 | 4·5 | 57·7 | 2·4 | 30·8 | 7·8 | 1·4 |
| 1961 දෙසැම්බර් .. | 4·8 | 35·8 | 5·6 | 41·8 | 3·1 | 23·1 | 13·4 | 2·4 |
| 1962 ජූනි .. | 9·5 | 55·6 | 5·9 | 34·5 | 1·7 | 9·9 | 17·1 | 3·0 |
| **එකතුව** | | | | | | | | |
| 1961 සැප්තැම්බර් .. | 181·4 | 32·5 | 285·9 | 51·2 | 91·3 | 16·3 | 558·6 | 100·0 |
| 1961 දෙසැම්බර් .. | 182·2 | 33·2 | 277·3 | 50·5 | 89·1 | 16·2 | 548·6 | 100·0 |
| 1962 ජූනි .. | 192·6 | 33·5 | 288·2 | 50·1 | 94·0 | 16·4 | 574·9 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

*අත්තිකාරම්වලට ණය, අයිරාවන් සහ වට්ටම් කළ බිල් පත් ඇතුළත් වෙයි.

1962 ජූනි මාසයෙන් අවසන් වූ අඩ වසර තුළ අත්තිකාරම් රුපියල් කෝටි 54·86 සිට රුපියල් කෝටි 57·49 තෙක් රුපියල් කෝටි 2·63 කින් ඉහළ ගියේය. කර්මාන්ත සඳහා දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 2·4 සිට රුපියල් කෝටි 3·15 තෙක් රුපියල් කෝටි 0·75 කින් වැඩිවිය. පාරිභෝගික කටයුතු සඳහා අත්තිකාරම් රුපියල් කෝටි 3·27 සිට රුපියල් කෝටි 3·82 තෙක් රුපියල් කෝටි 0·55 කින් වැඩිවිය. ''අනෙකුත් ණය'' රුපියල් කෝටි 1·34 සිට රුපියල් කෝටි 1·71 තෙක් රුපියල් කෝටි 0·37 කින් වැඩිවිය. වාණිජ අත්තිකාරම්, රුපියල් කෝටි 37·92 සිට රුපියල් කෝටි 39·12 තෙක් රුපියල් කෝටි 1·20 කින් වැඩිවිය. මූල්‍ය

කටයුතු සඳහා දෙනලද අත්තිකාරම්, 1961 දෙසැම්බර් මාසයේදී රුපියල් කෝටි 8·87 ක් වුවද 1962 ජූනි වන විට රුපියල් කෝටි 8·48 තෙක් රුපියල් කෝටි 0·39 කින් අඩුවූ අතර, කර්මාන්ත කටයුතු සඳහා දෙන ලද අත්තිකාරම් වැඩිවිය. කෘෂිකාර්මික අත්තිකාරම් ද රුපියල් කෝටි 1·06 සිට රුපියල් කෝටි 1·20 තෙක් රුපියල් කෝටි 0·14 කින් වැඩිවිය. වාණිජ කටයුතු සඳහා අවශ්‍ය වූ මුදල් ප්‍රධාන වශයෙන් වැඩි වූයේ අපනයන වෙළෙඳාම සඳහා බැංකු වලින් මුදල් ඉල්ලුම් වැඩිවූ නිසාය. මූල්‍ය කටයුතු සඳහා දෙන ලද අත්තිකාරම් අඩුවීමෙන් පිළිබිඹු වන්නේ කෙළින්ම හෝ, කුලීපිට බඩුදෙන සමාගම් මාර්ගයෙන් හෝ කුලී පිට බඩු ගැනීමේ ගනුදෙනු සඳහා බැංකු වලින් දෙන ලද මුළු ණය ප්‍රමාණය අඩුකිරීමය. කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ විශාල සංඛ්‍යාවක්ම ගෙන්වීම පහත වැටී තිබෙන අවධියක පාරිභෝගික කටයුතු සඳහා දෙන ලද ණය, රුපියල් කෝටි 3·82 තෙක් වැඩිවීම මෙහිදී සැලකිල්ලට ගත යුතුය. මෙය 1961 සැප්තැම්බර් මාසයේ සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 0·8 කින් වැඩිය. පුද්ගලයිනට දෙන ණයත්, මේ ශීර්ෂය යටතේ වර්ග කැරෙන නිසා සමහරවිට මේ වැඩිවීම එසේ පුද්ගලයිනට දෙන ණය වැඩිවීම නිසා විය හැකිය. 1961 සැප්තැම්බර් මාසයේ සිට1962 ජූනි වන විට වාණිජ කටයුතු සඳහා දෙන ලද ණයවල සියයට ගණන සියයට 70·3 සිට සියයට 68·0 තෙක් පහළ වැටී ඇත. මේ අනුව ණයදීම පුරුදු මාර්ග වලින් වෙනස් කොට ඇති බව හෙළි වෙයි. මේ කාලය තුළදී කෘෂිකාර්මික අත්තිකාරම් මුළු බැංකු අත්තිකාරම් වලින් සියයට 1·9 සිට සියයට 2 තෙක් වැඩිවී ඇත. කාර්මික කටයුතු සඳහා අත්තිකාරම් සියයට 5·1 සිට සියයට 5·5 තෙක් වැඩිවී ඇත. ඉහත දැක්වෙන සංඛ්‍යා තොරතුරු අනුව අලුතෙන් ඇරැඹූ දේශීය කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපාර සඳහා වෙළෙඳ බැංකු විසින් දෙන ලද ණය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී නැති බව හෙළිවෙයි. මේ කාර්යයන් සඳහා වෙළෙඳ බැංකු වලින් ලැබිය හැකි මුළු ණය ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවැතෙමින් තිබිණි.

දෙන ලද අත්තිකාරම්, ඒ සඳහා තබා ඇති ඇප වර්ග අනුව වර්ග කොට, පහත සටහනේ දැක්වේ. මේ සංඛ්‍යා සැකසී ඇත්තේ අර්ධ වාර්ෂික සමීක්ෂණය පදනම් කොට ගෙනය.

සංඛ්‍යා සටහන II ඊ—6

## දෙනලද අත්තිකාරම් ඇප අනුව වර්ග කොට

| ඇප වර්ග | 1961 සැප්තැම්බර් 30 | | 1961 දෙසැම්බර් 31 | | 1962 ජූනි 30 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| ලේඛන ගත බිල්පත් .. .. .. | 148·5 | 26·6 | 140·2 | 25·6 | 147·2 | 25·6 |
| රජයේ සුරැකුම් පත් .. .. .. | 11·6 | 2·1 | 11·7 | 2·1 | 12·6 | 2·2 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. | 28·8 | 5·2 | 28·5 | 5·2 | 28·6 | 5·0 |
| ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් වටිනාකම ඇතුළුව, කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතු සහ අනෙකුත් මුදල් තැන්පතු .. | 20·4 | 3·7 | 23·3 | 4·2 | 26·4 | 4·6 |
| වෙළෙඳ තොග .. .. .. | 169·9 | 30·4 | 168·3 | 30·7 | 160·9 | 28·1 |
| නිශ්චල දේපොළ .. .. .. | 48·5 | 8·7 | 44·7 | 8·1 | 49·0 | 8·5 |
| අනෙකුත් .. .. .. | 62·0 | 11·1 | 76·0 | 13·9 | 88·4 | 15·4 |
| ඇප රහිත .. .. .. | 68·9 | 12·3 | 55·8 | 10·2 | 60·0 | 10·5 |
| එකතුව .. .. .. | 558·6 | 100·0 | 548·6 | 100·0 | 573·1 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1961 සැප්තැම්බර් සහ 1962 ජූනි මස අතර කාලය තුළ ඒ ඒ ඇප වර්ග පදනම් කොට වෙළෙඳ බැංකු විසින් දෙන ලද අත්තිකාරම්වල සැලකිය යුතු වෙනසෙක් ඇතිවී නොමැත. ලේඛන ගත බිල්පත් උඩ දෙන ලද අත්තිකාරම් සියයට 26·6 සිට සියයට 25·6 තෙක් පහළ වැටිණි. රජයේ සුරැකුම් පත් සහ, බද්ධ ව්‍යාපාර වස්තු කොටස් ඇප කොට දෙන ලද අත්තිකාරම් වෙනස්වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. එහෙත් ජීවිත සහතික ඔප්පු ඇතුළු මුදල් තැන්පතු ඇපයට තබා දෙනලද අත්තිකාරම් වසරා තුළදී සියයට 3·7 සිට සියයට 4·6 තෙක් වැඩි වී ඇත. වෙළෙඳ බඩු තොග ඇපයට තබාගෙන දෙනලද අත්තිකාරම් අනෙක් අත්තිකාරම් වලට වැඩියෙන්, සියයට 30·4 සිට සියයට 28·1 තෙක් අඩුවිය. මෙයින් එක් අතකින් පිට රටින් ගෙන්වන සමහර වර්ගවල බඩු තොග අඩුවීම පිළිබිඹු වෙයි. ඇප රහිත අත්තිකාරම් ද සියයට 12·3 සිට සියයට 10·5 තෙක් අඩුවී ඇති අතර, අනෙකුත් ඇප වර්ග යටතේ දෙනලද අත්තිකාරම් සියයට 11·1 සිට සියයට 15·4 තෙක් වේගයෙන් වැඩිවී ඇත.

අත්තිකාරම්, පොළී ප්‍රමාණය අනුව වර්ග කොට පහත සංඛ්‍යා සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ඊ—7

## අත්තිකාරම්—පොළී ප්‍රමාණයන් අනුව*

| පොළිය සියයට ගණන | 1961 සැප්තැම්බර් 30 | | 1961 දෙසැම්බර් 31 | | 1962 ජූනි 30 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | මුළු ප්‍රමාණයේ සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | මුළු ප්‍රමාණයේ සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | මුළු ප්‍රමාණයේ සියයට ගණන |
| 2½ට අඩු .. .. .. | 3·0 | 0·6 | 4·0 | 0·8 | 4·4 | 0·8 |
| 2½ .. .. .. | ... | ... | ... | ... | ... | ... |
| 3 .. .. .. | 1·8 | 0·4 | 2·0 | 0·4 | 1·8 | 0·3 |
| 3½ .. .. .. | 11·0 | 2·3 | 5·6 | 1·2 | 4·4 | 0·8 |
| 4 .. .. .. | 8·4 | 1·7 | 9·5 | 2·0 | 13·8 | 2·7 |
| 4½ .. .. .. | 16·5 | 3·4 | 17·8 | 3·7 | 15·6 | 3·0 |
| 5 .. .. .. | 19·7 | 4·1 | 19·7 | 4·1 | 19·9 | 3·8 |
| 5½ .. .. .. | 6·1 | 1·3 | 5·6 | 1·2 | 12·8 | 2·5 |
| 6 .. .. .. | 244·7 | 50·8 | 234·1 | 48·5 | 259·6 | 50·2 |
| 6½ .. .. .. | 33·9 | 7·0 | 78·2 | 16·2 | 49·1 | 9·5 |
| 7 .. .. .. | 86·5 | 18·0 | 87·7 | 18·2 | 112·6 | 21·8 |
| 7½ : .. .. | 41·7 | 8·7 | 5·0 | 1·0 | 10·6 | 2·0 |
| 8 සහ ඊට වැඩි .. .. | 8·3 | 1·8 | 13·7 | 2·8 | 12·6 | 2·4 |
| එකතුව .. | 481·8 | 100·0 | 482·9 | 100·0 | 517·2 | 100·0 |

සංඛ්‍යා —ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

*පවත්නා විනිමය ප්‍රමාණයට මිලට ගත් අපනයන බිල්පත් අත්හැර

1961 සැප්තැම්බර් අවසානයට සහ 1962 ජූනි අවසානයට දී ඇති අත්තිකාරම් පොළී ප්‍රමාණය අනුව වර්ග කොට සසඳා බලන විට, වෙළෙඳ බැංකු මඳක් වැඩි පොළියට අත්තිකාරම් දී ඇති බැව් හෙළිවේ. පසුගිය අවුරුදු වලදී මෙන්ම, වෙළෙඳ බැංකු ණය සහ අත්තිකාරම් සඳහා ඉතා මත් ජනප්‍රිය පොළී ප්‍රමාණය වූයේ සියයට 6 පොළියයි. දෙනලද මුළු ණය සහ අත්තිකාරම් වලින් සියයට 50·2 ක්ම මේ පොළියට ලබා ගත හැකිවිය. 1961 දෙසැම්බර් මාසයේ පැවැති තත්ත්වය අනුව මෙන් නොව, සියයට 6½ පොළියට දෙනලද ණය ප්‍රමාණය කුඩාවිය. මේ වර්ගයේ ණය සියයට 16·2 සිට සියයට 9·5 තෙක් අඩුවී ඇති අතර, සියයට 7 පොළියට දෙන ලද ණය ප්‍රමාණය සියයට 18·2 සිට සියයට 21·8 තෙක් වැඩිවිය. තවද සියයට 7½ ණය සියයට 1·0 සිට සියයට 2 තෙක් වැඩිවිය. නිශ්චල දේපොළ ඇපයට තබාගෙන

වෙළෙඳ බැංකු වලින් දෙන ණය සහ අයිරාවන් සඳහා අය කරන පොළී ප්‍රමාණය ද වැඩි වී ඇත. නිශ්චල දේපළ ඇපයට තබාගෙන දෙන ණය සඳහා උපරිම පොළිය, 1962 ජූනි මාසයේදී සියයට 8 සිට සියයට 9 තෙක් වැඩිවිය. ණය සහ අත්තිකාරම් සඳහා වෙළෙඳ බැංකු වලින් අය කැරෙන අනෙකුත් පොළී ප්‍රමාණයන්හි වෙනසෙක් ඇති නොවීය.

### බැංකු නිෂ්කාශනය

බැංකු නිෂ්කාශනයේ මාසික සාමාන්‍යය 1961 රුපියල් කෝටි 74·28 ක් වූ අතර 1962 දී රුපියල් කෝටි 71·16 තෙක් අඩුවිය. අවුරුද්දේ මුල් තෙමස තුළ සාමාන්‍ය බැංකු කටයුතු අත්හිටවීම නිසා බැංකු නිෂ්කාශනය ඉතාමත් පහත් මට්ටමක පැවැතිණි. 1962 අප්‍රේල් මාසයේදී මෙය රුපියල් කෝටි 167·36 තෙක් සීඝ්‍රයෙන් වැඩිවිය. මෙයට හේතු වූයේ මාරු නොකර ගොඩගැසී තුබුන චෙක්පත්, මාරු කිරීම සඳහා ඉදිරිපත් කිරීමය. නිෂ්කාශනයට ඉදිරිපත් කැරුන මුළු චෙක්පත් ප්‍රමාණය අඩුවීමට බොහෝ සෙයින් හේතුවූයේ බැංකු ආරාවුල පැවැති කාලයේදී චෙක්පත් වලට වඩා මුදල් භාවිතා කිරීම විය.

### අනෙකුත් මූල්‍ය ආයතන

තැපැල් කන්තෝරු සේවින්ග්ස් බැංකුවේද, ලංකා සේවින්ග්ස් බැංකුවේද, වෙළෙඳ බැංකු වල සහ ඉතිරි කිරීම් සහතික වලද, තැන්පත් වූ මුළු ඉතිරි කිරීම් තැන්පතු ප්‍රමාණය, රුපියල් කෝටි 82·37 සිට රුපියල් කෝටි 88·82 තෙක් රුපියල් කෝටි 6·45 කින් වැඩිවිය. මෙයින් වැඩි වශයෙන්ම ඉහළ ගොස් ඇත්තේ වෙළෙඳ බැංකුවල කාලීන සහ ඉතිරි කිරීම් තැන්පතුය. මෙය, රුපියල් කෝටි 36·38 සිට රුපියල් කෝටි 42·64 තෙක් රුපියල් කෝටි 6·26 කින් වැඩිවිය. තැපැල් කන්තෝරු සේවිංග්ස් බැංකුවේ තැන්පතු රුපියල් කෝටි 35·19 සිට රුපියල් කෝටි 35·56 තෙක් රුපියල් කෝටි 0·37 කින් වැඩිවිය. පසුගිය වසරේ තැපැල් කන්තෝරු සේවිංග්ස් බැංකුවේ තැන්පතු රුපියල් කෝටි 0·85 කින් වැඩිවිය. ලංකා සේවිංග්ස් බැංකුවේ මුළු ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 0·2 කින් අඩුවිය. පසුගිය වසරේ අඩුවීම රුපියල් කෝටි 0·02 ක් විය. ලංකා සේවිංග්ස් බැංකුවේ තැන්පතු සඳහා ගෙවන පොළී ප්‍රමාණය සියයට $2\frac{1}{2}$ සිට සියයට 3 දක්වා 1962 ජනවාරි මාසයේදී වැඩි කළ ද, එම බැංකුවේ තැන්පතු අඩු වී ඇත. වෙළෙඳ බැංකුවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු 1962 ජූනි මාසයේ සිට සීඝ්‍ර වැඩිවීමක් දක්වයි. වැඩිවීම බොහෝ සෙයින්ම ඇතිවූයේ තැන්පතු රුපියල් කෝටි 2·49 කින් වැඩි වූ 1962 ඔක්තෝබර් මාසයේ සහ දෙසැම්බර් මාසය අතරය. මෙසේ වෙළෙඳ බැංකුවල වැඩිවූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වලින් සෑහෙන ප්‍රමාණයක් මූල්‍ය ආයතන සතු වූ අතර, ඉතිරි කොටස, වෙළෙඳ සමාගම් සහ ආයතන සතු විය.

සංඛ්‍යා සටහන II ඊ—8

### ඉතිරි කිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සහතික

රුපියල් දශ ලක්ෂ

| | 1961 අවසානයේ දී | 1962 අවසානයේ දී | වෙනස |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු සේවින්ග්ස් බැංකුව .. | 351·9 | 355·6* | + 3·7 |
| ලංකා සේවින්ග්ස් බැංකුව .. .. | 75·3 | 73·3* | − 2·0 |
| වෙළෙඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු) .. .. .. | 363·8 | 426·4 | + 62·6 |
| නොබෙරු ඉතිරි කිරීම් සහතික .. .. | 32·7 | 32·9 | + 0·2 |
| එකතුව .. .. | 823·7 | 888·2* | + 64·5 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* තාවකාලිකයි

1962 දී සේවක අර්ථසාධක අරමුදලට එකතු වූ මුළු මුදල රුපියල් කෝටි 5·82 ක් විය. පසුගිය වසරේ එකතුව රුපියල් කෝටි 5·7 ක් විය. මේ අනුව පසුගිය වසරට වඩා 1962 දී රුපියල් කෝටි 0·12 ක් එකතු වී ඇත. අරමුදලේ මුළු එකතුව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවී නොමැත. මෙයට හේතු වූයේ රටේ ඇති ප්‍රධාන වෘත්තීන් සියල්ලක්ම වාගේ අරමුදල යටතට ගෙන තිබීම නිසා ඇතුළත් නොවුන වෘත්තීන් ඇතිවූයේ සුළු ගණනක් වීමය.

සංවර්ධන මුදල් සමායතනයේ 1962 මුදල් ගනුදෙනු අනුව, නොබේරා ඇති ණය සහ කොටස් රුපියල් කෝටි 2·09 සිට රුපියල් කෝටි 2·28 තෙක් රුපියල් කෝටි 0·19 කින් වැඩි වී ඇති බව හෙළිවෙයි. එහෙත් නොබේරා ඇති ණය සහ කොටස් වල මේ වැඩිවීම 1961 වැඩි වූ රුපියල් කෝටි 0·3 ට වඩා අඩුය. 1962 සමායතනයෙන් දෙනලද ණය එතරම් වැඩි නොවීමෙන් සමායතනයට ණයදීම සඳහා අලුත් ධන මාර්ග නොමැති වූ බව හෙළිවෙයි. 1962 මාස දෙළස තුළ සමායතනයෙන් දෙනලද මුළු ණය රුපියල් කෝටි 0·29 ක් විය. පසුගිය වසරේ දෙනලද ප්‍රමාණය, රුපියල් කෝටි 0·43 ක් විය. අවුරුද්ද තුළදී වැඩිවූ මුළු ණය ප්‍රමාණය සහ, දෙනලද ණය ගණන අනුව බලන විට සමායතනයෙන් දෙන ලද ණය වල සියයට ගණනින් වැඩි ප්‍රමාණයක් දී ඇත්තේ කුඩා ව්‍යාපාර සහ කර්මාන්ත සඳහා බව හෙළිවෙයි.

කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සමායතනයේ ණය ගනුදෙනු වල ඉතාමත් සැලකිය යුතු ලක්ෂණය වී ඇත්තේ නොබේරා ඇති ණය ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවී යාමය. පසුගිය වසරේ මුළු ණය රුපියල් කෝටි 0·08 කින් අඩු වී ගිය අතර සමාලෝචනයට භාජනය වී ඇති වසරේ එය රුපියල් කෝටි 0·1 කින් අඩුවිය. පසුගිය වසරේ මෙන්ම මේ වසරේ ද සමායතනයේ ධන මාර්ග වැඩි නොවූ නිසා අලුත් ණය සම්පූර්ණයෙන්ම දී ඇත්තේ ගෙවන ලද ප්‍රාග්ධනවලිනි. කෘෂිකාර්මික කටයුතු සඳහා 1962 දී දී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 0·2 ක් විය. 1961 දී දී ඇති ප්‍රමාණය රුපියල් කෝටි 0·26 ක් විය. කාර්මික කටයුතු සඳහා දී ඇති ණය 1961 දී රුපියල් කෝටි 0·06 ක් වූ අතර, 1962 දී එය රුපියල් කෝටි 0·03 කින් රුපියල් කෝටි 0·03 තෙක් අඩුවිය. මේ අනුව සමායතනයේ ධනමාර්ග සීමා සහිත වුවද, කෘෂිකාර්මික හා කාර්මික කටයුතු සඳහා ණය දීමේ මෙතෙක් ගෙන ගිය ප්‍රතිපත්තිය තව දිගට ගෙන ගොස් ඇති බව හෙළිවෙයි. 1961 රජයේ උකස් බැංකුවේ මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 0·02 කින් වැඩිවිය. එහෙත් 1962 මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 0·04 කින් අඩුවූයේ රුපියල් කෝටි 5·63 සිට රුපියල් කෝටි 5·59 තෙක් අඩුවිය. රජයේ උකස් බැංකුවට ද අලුත් ණය අරමුදල් ලබා ගැනීමට නොහැකි වූයෙන්, ආයතනයෙන් දෙනලද බොහෝ ණය දී ඇත්තේ නැවත ගෙවන ලද ප්‍රාග්ධන වලිනි. පසුගිය වසරේ දී මෙන් බැංකුව ණයකර කිසිවක් නිකුත් කළේ නැත. මෙයට හේතු වූයේ පසුගිය වර්ෂය මෙන් ණය වැඩි නොවී මේ වර්ෂයේ ණය අඩුවී යාමය.